**මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 2 ව්‍යාපෘතිය - 2020**

-----------------------------------------------------------------------------------------------------------------

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ - 2 ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 ජුනි 03 දින අංක 3030-එස්ආර්අයි(එස් එෆ්) දරන ණය ගිවිසුමේ II පරිච්ඡේදයේ 2.10 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ණය ගිවිසුම් වලට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සම්පාදන හා අපජලය සේවා පිළිබඳ කාර්යක්ෂමතාවය හා මූල්‍ය තිරසාරත්වය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතිය සංරචක 8 යටතේ ක්‍රියාත්මක වේ. (i) කොළඹ නගරයේ දකුණු කොටසෙහි ආදායම් නොලබන ජලය අඩුකිරීම සඳහා වූ පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව (ii) කොළඹ නගරයේ බටහිර කොටසෙහි ආදායම් නොලබන ජලය අඩුකිරීම සඳහාවූ පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව (iii) මහරගම ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ ඉහළ මහල 02 ඉදිකිරීම (iv) පාමංකඩ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය සඳහා කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම (v) මධ්‍යම පුහුණු මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම (vi) එළිහවුස් ජලාශ පරිශ්‍රයේ යෝජිත පොම්පාගාරයේ සිවිල් වැඩ (vii) එළිහවුස් ජලාශ පරිශ්‍රයේ යෝජිත පොම්පාගාරයේ යාන්ත්‍රික හා ඉලෙක්ට්‍රොනික් වැඩ හා (viii) කොළඹ නගරය සඳහා උපදේශනය සහ සහභාගීත්ව ක්‍රියාකාරකම් සමඟ ප්‍රජාවන්ගේ ධාරිතා වර්ධනය. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 15,340 කට සමාන එජඩො මිලියන 118 ක් වූ අතර ඉන් රු.මිලියන 9,100 හෝ සියයට 59.3 කට සමාන එජඩො මිලියන 70 ක් ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් මගින් මූල්‍යයනය කිරීම සඳහා හා රු.මිලියන 2,340 හෝ සියයට 15.3 කට සමාන එජඩො මිලියන 18 ක් ආසියානු සංවර්ධන අරමුදලෙන් මූල්‍යයනය කිරීම සඳහා එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 3,900 හෝ සියයට 25.4 කට සමාන එජඩො මිලියන 30 ක් ශ්‍රී ලංකා රජය විසින් දායක වීමට අපේක්ෂා කර තිබුණි. තවද, වැඩසටහනේ මුළු ඇස්තමේන්තුගත පිරිවැයෙන් රු.මිලියන 13,917 කට සමාන එජඩො මිලියන 107.05 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සිදු කිරීමට අපේක්ෂිත වැඩසටහනේ කාර්යයන් සඳහා වෙන් කර තිබූ අතර රු.මිලියන 1,423 කට සමාන එජඩො මිලියන 10.95 ක් කොළඹ මහනගර සභාව විසින් සිදු කිරීමට අපේක්ෂිත වැඩසටහනේ කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහනේ කාර්යයන් පිළිබඳ නිරීක්ෂණයන්ගෙන් මෙම වාර්තාව සමන්විත වේ. වැඩසටහන එහි කාර්යයන් 2014 සැප්තැම්බර් 03 දින ආරම්භ කරන ලද අතර 2019 ජුනි 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් 2022 ඔක්තෝම්බර් 15 දක්වා ව්‍යාපෘති කටයුතු කිරීමට කාලය දීර්ඝ කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණුවල බලපෑම හැර, වැඩසටහනේ -ව්‍යාපෘතිය 02 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීමයන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ. ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, ව්‍යාපෘති◌ාය් අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර,  ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම.**

**2.1. ගිණුම්කරණ අඩුපාඩු**

| අනු අංක | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| | -------------------- | ----------- | ------------------------------ | ---------------------- |
| | | රු. මිලියන | | |
| (අ) | වටිනාකම වූ රු.මිලියන 233.56 ක විනිමය ලාභ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූල්‍ය ප්‍රභවය යටතේ වෙනමව පෙන්වනවා වෙනුවට වැරදි ලෙස කෙරීගෙන යන වැඩ ගිණුමෙන් අඩුකර තිබුණි. | 233.56 | අප විගණකවරුන්ගේ නිර්දේශයට අනුකූල වන අතර ඒ අනුව ගිණුම් සකස් කරනු ලැබේ. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විනිමය ලාභය මූල්‍ය ප්‍රභවය යටතේ වෙනමව නිරූපණය කළ යුතුය. |
| (ආ) | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා මහා නගර සභාව ක්‍රියාත්මක කරනු ලබන ණය අංක 3030 සඳහා ණය නියෝජිතායතනය විසින් අයකරනු ලැබූ එකතුව වූ ඇ.එ.ජ.ඩො 513,119 ට සමාන රු.මිලියන 79.64 ක පොලි ගාස්තු ක්‍රියාත්මක කරනු ලබන නියෝජ්‍යායතන අතර බෙදා වෙන් කොට 2020 දෙසැම්බර් 31 දක්වා වූ මූල්‍ය ප්‍රකාශන වෙත ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, ලද ණය වෙන් නොකල වටිනාකමකින් අඩු වී තිබුණි. | 79.64 | කොළඹ මහ නගර සභාව සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය එක්ව පොළී හා බැඳීම් ගාස්තු වෙන් කිරීම සඳහා නිසි යාන්ත්‍රණයක් සකස් කරනු ලබන අතර 2021 වර්ෂයේ සිට ගිණුම් පොත්වල ගිණුම්ගත කෙරේ. | ණය නියෝජිතායතනය විසින් සෘජුව අයකරනු ලැබූ අදාල පිරිවැය ගිණුම් වෙත ගෙන ආ යුතු අතර වර්ෂය අවසානයේදී උපයෝජනය කරන ලද ණය ප්‍රමාණය පෙන්විය හැකිය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ණය අංක 3029 සඳහා 2015 වර්ෂයේ සිට 2020 දක්වා අයකරන ලද බැඳීම් ගාස්තු හා පොළී ගාස්තු වූ රු.මිලියන 446.86 ක වටිනාකමක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ආසියානු සංවර්ධන බැංකුවේ ණය ලෙස පෙන්වනවා වෙනුවට භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන ලෙස පෙන්වා තිබුණි. තවද, මින් 2019 දෙසැම්බර් 31 දක්වා අයකරන ලද රු.මිලියන | 446.86 | අප විගණකවරුන්ගේ නිර්දේශයට අනුකූල වන අතර ඒ අනුව ගිණුම් සකස් කරනු ලැබේ. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද ණය ලෙස ගිණුම්ගත කිරීම හා භාණ්ඩාගාර ප්‍රදාන වල ගැලපීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | 307.87 ක් පෙර වර්ෂයේ ගැලපුම් ලෙස ගලපනවා වෙනුවට ප්‍රවර්තන වර්ෂයේ ගණුදෙනු ලෙස මූල්‍ය ප්‍රකාශන වෙත ගෙන තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශන තුල මීට සමාන ප්‍රමානයකින් මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහයන් හා මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහයන් වැඩියෙන් දක්වා තිබුණි. | | | |
| (ඈ) | 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා එකතුව රු.මිලියන 273.26 ක එකතු කල අගය මත බදු පෙර වර්ෂයේ ගැලපුම් ලෙස ගලපනවා වෙනුවට ප්‍රවර්තන වර්ෂයේ ගණුදෙනු ලෙස මූල්‍ය ප්‍රකාශන වෙත ගෙන තිබුණි.මෙහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයන් සහ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහයන් මීට සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි. | 273.26 | අප විගණකවරුන්ගේ නිර්දේශයට අනුකූල වන අතර ඒ අනුව ගිණුම් සකස් කරනු ලැබේ. | පෙර වර්ෂවල සමුච්චිත ශේෂයන් පෙර වර්ෂයේ ගැලපුම් ලෙස ගැලපිය යුතුය. |
| (ඉ) | ව්‍යාපෘතිය වෙනුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මහජන බැංකුව වෙත ගෙවන ලද රු.මිලියන 124.68ක ණය පොළීය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ වෙත ගෙන නොතිබුණි. | 124.68 | ව්‍යාපෘති ගිණුම් අවසන් කිරීමෙන් පසු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ලෙජරයේ මෙම සටහන යාවත්කාලීන කර ඇත. මෙම සටහන ව්‍යාපෘති පොත්වල පසුව ගිණුම් ගත කරනු ඇත. | ව්‍යාපෘතිය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර අදාල සියළු ව්‍යාපෘති වියදම් ගිණුම් ගත කිරීමට පියවර ගත යුතුය. |

**2.2. නීති, , රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසි සඳහා යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| 2019 මාර්තු 15 දිනැති 2019/01 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි 2.3.2 වගන්තිය අනුව ව්‍යාපෘති කළමනාකරණය කාර්යක්ෂමතාවය සහතික වීම පිණිස සැමවිටම ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා පූර්ණ කාලීන පදනමින් බඳවා ගත යුතුය. | 2021 පෙබරවාරි 02 දින සිට ප්‍රධාන කාර්යාලයේ පාරිභෝගික කළමනාකරණ හා වත්කම් කළමනාකරණ අංශයේ රාජකාරි ආවරණය කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයා අතිරේක සාමාන්‍යාධිකාරි ලෙස උසස් කර ඇත. එබැවින් ව්‍යාපෘති කටයුතු කඩිනම් කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයාගේ පූර්ණ කාලීන සේවාව ලබා ගැනීමට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වහාම පියවර ගත යුතුය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නව තනතුර තවමත් තහවුරු කර නොමැති අතර එය වැඩ බලන තනතුරකි. එසේම ව්‍යාපෘති 01 අවසන් අදියරේ පවතී. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ තහවුරු කිරීම මත පදනමව සැමවිටම ව්‍යාපෘති අධ්‍යක්ෂක තනතුර වෙනස් කිරීමට ජාතික ජල සම්පාදන මණ්ඩලයේ කළමනාකාරිත්වය තීරණය කරනු ඇත. | ව්‍යාපෘතිය කටයුතු කඩිනම් කිරීම් සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයාගේ පූර්ණ කාලීන සේවාව ලබා ගැනීමට පියවර ගත යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය.**

**3.1. භෞතික ප්‍රගතිය.**

ව්‍යාපෘතියේ ප්‍රගතිය වර්තාවට අනුව, 2020 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 61.5 කි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුල ව්‍යාපෘතිය අත්කරගෙන ඇත්තේ සියයට 14.90 ක් පමණි. ව්‍යාපෘතියේ සංරචක වශයෙන් ප්‍රගතිය පහත පරිදි වේ.

| අනු අංක | ක්‍රියාකාරකම් | ඒකකය | අපේක්ෂිත ඉලක්ක | 2020 දෙසැම්බර් 31 දිනට ඉලක්ක ළඟාකර ගැනීම්. | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|---|---|---|
| | ------------------ | ---------- | ------------ | ------------- | ---------- | ---------------------------------- | --------------- |
| (අ) | කොළඹ නගරයේ දකුණු කොටසෙහි ආදායම් නොලබන ජලය අඩු කිරීම සඳහා පද්ධති පුනරුත්ථාපනය. | | | | ව්‍යාපෘති කාලය දීර්ඝවීමේ හැකියාව | | කොන්ත්‍රාත්කරුගේ ප්‍රගතිය සමීපව සුපරීක්ෂණය කල යුතු අතර වැඩ කඩිනම් කිරීමට උපදෙස් ලබා දිය යුතුය. |
| | • නල එළීම. | මීටර් | 209,576.44 | 119,078.95 | | | |
| | • සම්බන්ධතා මාරු කිරීම. | නිවාස ඒකක | 32,956 | 3,455 | | | |
| | • දිස්ත්‍රික්ක මැනුම් ප්‍රදේශ ප්‍රගතිය. | සංඛ්‍යාව | 23 | - | | | |
| | • සමස්ථ කොන්ත්‍රාත් ප්‍රගතිය | ප්‍රතිශතය | 55.7 | 51.3 | | | |
| (ආ) | කොළඹ නගරයේ බටහිර කොටසෙහි ආදායම් නොලබන ජලය අඩු කිරීම සඳහා පද්ධති පුනරුත්ථාපනය. | | | | ව්‍යාපෘති කාලය දීර්ඝවීමේ හැකියාව | කොවිඩ් වසංගතය හා අනෙකුත් නොවැලැක්විය තත්ත්වයන් නිසා ඉලක්ක සම්පූර්ණ කර ගැනීමේ දිනයෙන් ඉවත් විය. කාලය දීර්ඝ කිරීම 2021 දෙසැම්බර් දක්වා නිර්දේශ කර ඇත. (කරුණාකර ඇමුණුම 01 බලන්න) | |
| | නල එළීම. | මීටර් | 109,146 | 93,639 | | | |
| | සම්බන්ධතා මාරු | නිවාස ඒකක | 8,528 | 3,453 | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | කිරීම. | සංඛ්‍යාව | 18 | 02 | | | |
| | දිස්ත්‍රික්ක මැනුම් ප්‍රදේශ ප්‍රගතිය. | ප්‍රතිශතය | 75.6 | 72.4 | | | |
| | සමස්ථ කොන්ත්‍රාත් ප්‍රගතිය | | | | | | |
| | • ඇස්තමේන්තුගත නල එළීම් සහ සේවා මාරු කිරීම් සංශෝධනය වී ඇත. | | | | | | |
| (ඇ) | පාමංකඩ කලාප ඉංජිනේරු කාර්යාලය සඳහා කාර්යාල ගොඩනැලිල්ලක් ඉදිකිරීම. | ඉදිකිරීම් සඳහා ඉඩමක් නොමැතිකම හේතුවෙන් ඉදිකිරීම් ආරම්භ කර නොමැත. කෙසේ වෙතත්, මිල්කෝ සමාගමෙන් නව ඉඩමක් ලබා ගැනීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී. | | | ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීම ප්‍රමාද වීම. | නව ඉඩමෙහි පිහිටීම වෙනස් වීම නිසා නව ඉඩමෙහි ස්ථානය අනුව සැලසුම් කටයුතු වෙනස් කිරීමට සිදු විය. | ඉඩම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමටත්, ප්‍රමාදයකින් තොරව ඉදිකිරීම් ආරම්භ කිරීමටත් පියවර ගත යුතුය. |
| (ඈ) | යෝජිත පුහුණු මධ්‍යස්ථානය, නේවාසිකාගාර ගොඩනැගිල්ල සහ ආපනශාලාව ඉදිකිරීම | ප්‍රතිශතය | 80 | 64.6 | ඉදිකිරීම් ප්‍රමාද වීම සහ ව්‍යාපෘති කාලය දීර්ඝ වීමේ හැකියාව. | 2020 දෙසැම්බර් දක්වා පැවති තර්ජනය (කොවිඩ් 19) දි පවා යෝජිත පුහුණු මධ්‍යස්ථානය, නේවාසිකාගාර ගොඩනැගිල්ල හා ආපන ශාලාව ඉදිකිරීම් කටයුතුවල නියැලී සිටින අධීක්ෂණ කාර්යමණ්ඩලය හැර, දෛනිකව සමාන්‍යයෙන් සේවකයින් 120 ක් සිටි න ලදි. නමුත්, 2021 ජනවාරි සිට බොහෝ සේවකයින් ප්‍රතිදේහජනක/පීසිආර් පරීක්ෂණ වලින් පසු කෝවිඩ් 19 ධනාත්මක වු | දීර්ඝ කිරීම් කරන ලද කොන්ත්‍රාත් කාලය තුල කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීම සඳහා උපදෙස් ලබා දිය යුතු අතර කොන්ත්‍රාත්කරුගේ ප්‍රගතිය සමීපව සුපරීක්ෂණය කල යුතුය. |

සේවකයින් කිහිපදෙනෙකු සමඟ පළමු ආශ්‍රිතයන් වීම හේතුවෙන් සේවකයින් තදාසන්න ප්‍රදේශවල රඳවා ගැනීමට දුෂ්කර විය.ඔවුන් කිසිවෙකු ආසාදිතයින් නොවන බව තහවුරු වන තුරු වැඩ බිමේ කොටසක් තුළ හුදකලා කිරීමට සිදු වීය. එවැනි කණගාටු තත්ත්වයක් පරිශ්‍රය තුල සිදුවීමෙන් අනතුරුව සේවකයින් පූර්ණ ලෙස සේවය කිරීමට මැලිකමක් දැක්විය. කොවිඩ් 19 වැලැක්වීමේ සෞඛ්‍ය නිර්දේශ පිළිපැදීමෙන් එනම්, සීමාකිරීම් වැඩබිම තුල බාහිර ශ්‍රමික සංඛ්‍යාවක් යෙදවීම හා නවාතැන් ගැනීම අවසරලත් මට්ටමට සීමාවීම නිසා කාර්යක්ෂමතාවය නැතිවීමට හේතු වී තිබේ. ව්‍යාපෘතියේ ප්‍රගතියට අහිතකර ලෙස බලපා ඇති ඉහත ප්‍රකාශන හේතු සහ ඉදිකිරීම් මුල් අවධියේ පවත්වාගෙන ගිය පරිදි ව්‍යාපෘතියේ වේගය අඩුවීමට හේතු විය. එබැවින්, ඉහත කරුණු සලකා බැලීමෙන් ව්‍යාපෘතිය සතුටුදායක ලෙස නිම කිරීම සඳහා කොන්ත්‍රාත්තුවේ කාල සීමාව දීර්ඝ කිරීම සඳහා නිර්දේශ කරනු ලැබේ.

## 3.2. කොන්ත්‍රාත් පරිපාලනය

| අනු අංක | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | කොළඹ නගරයේ දකුණ කොටසෙහි ආදායම් නොලබන ජලය අඩුකිරීමේ පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව යටතේ (අයිසීබී - 04) වැඩ කටයුතු 2021 ජුනි 04 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට කොළඹ දකුණෙහි දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 23ක නල එළීම් මීටර් 209,576.44 කින් මීටර් 119,078.95කට සමාන සියයට 56.81 පමණක්ද, සේවා මාරු කිරීම් (අදියර 2 ) 32,956 න් 3,455ක සේවා මාරු කිරීම් සම්පූර්ණ කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දින දක්වා මින් දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 2ක නල එළීම් මීටර් 24,280.50ක් සහ සේවා මාරු කිරීම් 3,122ක් ඇතුළුව වැඩ ආරම්භ කර නොතිබුණි. කෙසේ වෙතත්, දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 23 න් කිසිදු දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශයක් සම්පූර්ණ කර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත භාර දී නොතිබුණි. කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ දුර්වල අධීක්ෂණය සහ සුපරීක්ෂණය, කොන්ත්‍රාත්කරුගේ දෛනික ක්‍රියාකාරකම් අඩු සංඛ්‍යාවක් වීම හා අඩුම කම්කරුවන් සංඛ්‍යාවක් වැඩ බිම තුළ යෙදවීම, ක්‍රියාකාරි සැලැස්ම අනුව වැඩ සිදු නොකිරීම සහ කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය යනාදිය නිසා කොන්ත්‍රාත් කාල වු මාස 48න් මාස 42 ක් ගත වී තිබියදීත් කෙනේත්‍රාත්තුවේ සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 51.38 ක් පමණක් නිරූපණය විය. එබැවින් ඉතිරි එළීම් වැඩ මීටර් 90,497.49ක් සහ සේවා මාරු කිරීම් 29,461 ක් නියමිත කොන්ත්‍රාත් කාලය තුල නිම කිරීමට හැකි වේද යන්න සැකසහිතය. | ඉහත 4.1.1 යටතේ විස්තර කර ඇති හේතු හැරුණු විට වැඩ ප්‍රමාද වීම හෝ දෛනික ක්‍රියාකාරකම් කිසියම් දිනක කළ හැකි ප්‍රශස්ථ මට්ටමට වඩා අඩු නොවිය. පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කොන්ත්‍රාත්කරු පසුගිය වසරේ සිට කම්කරු ගැටළු වලට මුහුණ දී සිටියේය. බොහෝ පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයින් සිට පළාත්වලින් රැගෙන ඒම සිදුවීම නිසා ඔවුන් කොළඹ වැඩ කිරීමට මැලිකමක් දක්වයි. එසේ වුවද, සියළු සීමාවන් හා දුෂ්කරතා මධ්‍යයේ වුවද, කොන්ත්‍රාත්කරු අද දක්වා වැඩ අඛණ්ඩව කරගෙන යනු ලැබේ. පෙර විස්තර කල පරිදි, ඉහත සඳහන් හේතු සහ අනපේක්ෂිත තත්ත්වයන් හේතුවෙන් සැලසුම් කල වැඩ සැලැස්මට අනුව වැඩ කිරීමේ ප්‍රගතිය ඉවත් ව් ගියේය. දුෂ්කරතා මධ්‍යයේ වුවද, වර්තමාන තත්ත්වය යටතේ ස්ථාවර ප්‍රගතියක් ලබා ගැනීමට කොන්ත්‍රාත්කරුට හැකිවිය. | වැඩ කඩිනම් කිරීමට සහ කොන්ත්‍රාත්කරුගේ ප්‍රගතිය සමීපව නිරීක්ෂණය කිරීමට උපදෙස් දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොළඹ නගරයේ බටහිර කොටසෙහි ආදායම් නොලබන ජලය අඩු කිරීම සඳහා වන පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව (අයිසිබී 04) 2021 පෙබරවාරි 28 නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 18ක නල එළීම් මීටර් 109,146 න් මීටර් 93,639 ක කටයුතු ද, සේවා මාරු කිරීම් 8,528 න් සේවා මාරුවීම් (පියවර 2) 3,453 ක් සම්පූර්ණ කර තිබුණි. කෙසේ වෙතත්, 2020 දෙසැම්බර් 31 දක්වා දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 18න් මිනුම් ප්‍රදේශ 2ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට භාර දී තිබූ අතර දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 6ක් ආදායම් නොලබන ජලය අඩුකිරීමේ ඇගයීම් අදියරේ ක්‍රියාත්මක විය. 2020 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තුවේ සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 77.2 ක් වුවද, ඉතිරි නල එළීම් කටයුතු මීටර් 15,507 ක් සහ දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 10 සම්පූර්ණ කිරීමට නියමිත කොන්ත්‍රාත් කාලය තුල හැකි වේද යන්න සැකසහිතය. | කොවිඩ් වසංගතය සහ වෙනත් නොවැලැක්විය හැකි තත්ත්වයන් හේතුවෙන්, ඉලක්කගත නිම කිරීමේ දිනය ඉවත්විය. 2021 දෙසැම්බර් දක්වා කාලය දීර්ඝ කිරීම නිර්දේශ කර ඇති (ඇමුණුම - 01 බලන්න) | දීර්ඝ කරන ලද කාලය තුල කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට උපදෙස් ලබා දිය යුතු අතර සහ කොන්ත්‍රාත්තුවේ ප්‍රගතිය සමීපව නිරීක්ෂණය කල යුතුය. |
| (ඇ) | කොළඹ නගරයේ බටහිර කොටස (අයිසීබී - 3) සහ දකුණු කොටස (අයිසීබී - 4) ආදායම් නොලබන ජලය අඩුකිරීම සඳහා පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුවෙහි කොන්ත්‍රාත් ලේඛණ අනුව විවෘත කාණු ක්‍රමය නල එළීමට ක්‍රියාත්මක කිරීම වෙනුවට නල රිලයිනින් සහ බර්ස්ටින් (Relinning and bursting) (කාණු රහිත ක්‍රමය) ක්‍රියාත්මක කිරීමට මූලික සැලසුම් කර තිබූ අතර එය එක් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 30කට සමාන රු.මිලියන 3,513.45 ක් වෙන් කර තිබුණි. පසුව, නල මාර්ග අතර අන්තර් සම්බන්ධතා හඳුනා ගැනීම සඳහා නිසි දත්ත පදනමක් නොමැති වීම, කැපීමේ ස්ථාන, සේදීමේ සහ වායු කපාට පද්ධති සහ පොදු උපයෝගිතා සහ ඉදිකිරීම් අතරතුර විකල්ප නල මාර්ග ඔස්සේ පැය 24ක කාලය පුරා දිනකට උපරිම ඉල්ලුමෙන් සියයට 50ක් සැපයිය යුතු බවට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, ඉහත සඳහන් හේතුන් | ටෙන්ඩර් ලේඛණ සකස් කිරීමේ අදියරේදි 2012 හි ප්‍රධාන සැලසුම යාවත්කාලීන කිරීමේ අධ්‍යනය මගින් ලබා දුන් නිර්දේශයන්ට අනුව යෝජිත නල පුනරුත්තාපන කටයුතු වර්ගීකරණය කරන ලද අතර ඉහත අධ්‍යයනයෙන් සපයන ලද ජීඅයිඑස් මූලික හයිඩ්‍රොලික් ආකෘතියෙන් ප්‍රමාණයන් ලබා ගන්නා ලදි. මෙම ප්‍රධාන සැලැස්ම යාවත්කාලීන අධ්‍යයන කාලය තුල සිදු කරන ලද භෞතික විමර්ශන කටයුතු සීමිත වූ අතර බොහෝමයක් දත්ත එක්රැස්කර තිබුණේ අවසන් සැලසුම් වලින්, වැඩ බිම් පරීක්ෂාවෙන් සහ මෙහෙයුම් හා කාර්මික අංශයේ තොරතුරු යනාදියයි. එබැවින් ටෙන්ඩර් ලේඛණ පිළියෙල කරන ලද අදියර අතරතුර, ප්‍රධාන සැලැස්ම අධ්‍යනයෙන් යෝජිත රිලයිනින්(relining) වැඩ ඇතුලත් කිරීමට ප්‍රමාණවත් තොරතුරු නොතිබුණු අතර කොන්ත්‍රාත් ලේඛණයෙහි රිලයිනින් (relinining) වැඩ විෂයපථයට ඇතුලත් කර තිබුණි. පැකේජ 1 කොන්ත්‍රාත්තුව ආරම්භ | කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට පෙර ව්‍යාපෘතියේ විෂය පථය නිවැරදිව තීරණය කල යුතුය. |

ලංසු ලේඛණ පිළියෙල කිරීමට හෝ ශක්‍යතා අධ්‍යනයේදි සලකා නොලැබීම විගණනයට ගැටළු සහගත විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් තරඟකාරි ලංසු ඉදිරිපත් වීම සීමිත වූ අතර රිලයිනින් සහ බර්ස්ටින් (Relinning and bursting) යන නව තාක්ෂණ ක්‍රමවේදය බොහො ලංසුකරුවන්ට නොමැතිවීම නිසා තරඟකාරි ලංසු මගින් වාසි ලබා ගැනිමේ අවස්ථාව අහිමිවී ඇත. තවද, ඉහත සඳහන් විෂය පථය වෙනස් කිරීම සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේක 14 හි 8.13.4 වගන්තියෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

කිරීමෙන් පසුව සවිස්තරාත්මක සැලැසුම් කටයුතු වලට සමාන්තරව විමර්ශන කටයුතු සිදු කිරීම මඟින් පවතින නලවල සත්‍ය තත්ත්වය යෝජිත රිලයිනින් (relining) නල වල පවතින සේදුම් කපාට/ වායු කපාට හඳුනා ගැනීමේ අපහසුවීම, පවතින අන්තර් සම්බන්ධතා හඳුනා ගැනීමේ සංකීර්ණතාවය යනාදිය හඳුනා ගන්න ලද අතර ඒ අනුව, බෙදා හැරීමේ පද්ධතියේ රිලයිනින් (relining) වැඩ බැහැර කර සවිස්තරාත්මක සැලසුම් සිදු කරන ලදි.

## 3.3. වැඩ බිම් පරික්ෂාවෙන් සිදු කරනු ලද නිරීක්ෂණ

| අනු අංක | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සැලසුම් අංක W/097/BT 02 හි නල එලීම සඳහා පතුල සැකසීම- ඒ (bedding type A) අනුව ගල්කුඩු ඇතිරීම නලයේ මතුපිට සිට මිලිමීටර් 150(6') ඝනකමකින් තැබිය යුතු අතර සළකුණු පටිය (Marker tape) නල මතු පිට සිට මිලිමීටර් 300ක් ඇතුලත එළිය යුතුය. කොන්ත්‍රාත් පැකේජය 4හි දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ 33 සී හි රොබට් ග්‍රයිව් මාවතේ නල එලීම් වැඩ පිළිබඳ සිදු කරන ලද භෞතික විගණන පරික්ෂාවට අනුව ගල් කුඩු ඇතිරීමේ ඝනකම මිලිමීටර් 150(6') වෙනුවට මිලිමීටර් 100 (4') ක් වූ අතර නල මතු පිට සිට මිලිමීටර් 300 වෙනුවට මිලිමිටර 225 ක් ඇතුලත සළකුණු පටිය (Marker tape) එලීම කර ඇති බව නිරීක්ෂණය විය. ඊට අමතරව පිටතින් ගෙන්වන හෝ හාරන ලද පසු පිරවුම් ද්‍රව්‍යයන් පිළිවෙලින් මීලිමීටර් 15 සහ මිලිමීටර් 25ට වඩා වැඩියෙන් ගල් වලින් තොරව අදාල පසු පිරවුම් සඳහා භාවිතා කල යුතුය. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරු විසින් මිලිමිටර් 25ට වඩා වැඩි ගල්, කොන්ක්‍රීට් සහ ගඩොල් අංශු හාරන ලද පස් | වැඩ බිම් පරීක්ෂාව කොන්ත්‍රාත්කරු සිංහල අලුත් අවුරුදු කාලය සඳහා වසා දැමීමට ආසන්නත දිනයක් වන 2021 අප්‍රේල් 08 වන දින සිදු කර ඇත. එම මාර්ගය කැණීම් කරන ලද පස්, පෙරීම සමඟ වුවද පසු පිරවුම් කාර්යය සඳහා සුදුසු නොවන අතර ගල්කුඩු හා පිටතින් ගෙන්වන ලද පස් වලින් පිරවිය යුතුය. ඒවන විට කොන්ත්‍රාත්කරුට පසු පිරවුම සඳහා ප්‍රමාණවත් තරම් ගල්කුඩු නොතිබු අතර අළුත් අවුරුදු සඳහා වසා දැමීම හෙයින් ඇණවුම් කිරීමට සුදානම් නොවීය. එබැවින් අදාල දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශ ඉංජිනේරුවරයා නල එලීම සඳහා පතුල සැකසීම (bedding type ) සඳහා ගල්කුඩු සමඟ වැඩ කිරීමට ඉඩ දී ඇති අතර නල මතුපිට ප්‍රමාණය අඩුකර තිබූ අතරම ප්‍රගතියට බාධා නොවන පරිදි තාවකාලිකව කැණීම් කරන ලද පස් කාණුවෙහි පසු පිරවීම් කිරීම සහ අළුත් අවුරුද්දෙන් පසු අදාල ප්‍රමිතියට අනුව නැවත පසු පිරවුම් සිදු කරනු ලබයි. පී අයි යූ කාර්ය මණ්ඩලය විසින් පසු විපරම් කර එය නිවැරදිව සිදු කර | අදාල සැලසුම් හා ප්‍රමිතීන්ට අනුව නල එලීම් කටයුතු සිදු කල යුතු අතර පරිශ්‍රයේ කටයුතු සමීපව අධීක්ෂණය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (පෙරීමකින් තොරව) සමහ පසු පිරවුම් සඳහා යොදාගෙන ඇති බව නිරීක්ෂණය විය. | පසුව දෛනික වැඩබිම් වාර්තා අනුමත කරනු ලබේ. | |
| (ආ) | W/097/BT/02 දරන සැලසුම අනුව මාර්ග මතුපිට තාවකාලික මාර්ග පුනස්ථාපනය සිදු කිරීමේදී මිශ්‍ර ගල් (Aggregate Base Course) ඒබීසී ස්ථරය (ABC layer) මිලිමීටර් 275 ඝනකමකින් යුක්තව සියයට 98ක සම්පීඩනයකට ලක්කල යුතු අතර ඒබීසී ස්ථරය මතුපිට සීඑස්එස් තාර ටැක් කෝට් (Tack Coat) ලෙස යෙදිය යුතුය. 2021 අප්‍රේල් 27 දින කොන්ත්‍රාත් පැකේජය 4හි බෙල්ටොනා, ආදමලි සහ බියුකැනන් මාර්ග 3හි තාවකාලික මාර්ග පුනස්ථාපනය පිළිබඳව සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂණයට අනුව, තාවකාලික මාර්ග පුනස්ථාපනයෙහි ඒබීසී ස්ථරය නිසි ලෙස සම්පීඩනයට ලක් නොකර දූවිලි ඉවත් නොකර සීඑස්එස් තාර යොදා ඇති බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස ඒබීසී ස්ථරය සහිත ටැක් කෝට් (Tack Coat) කැඩී ගොස් ඇත. එබැවින් උප කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ සුපරීක්ෂණය සහ අධීක්ෂණය නොමැතිකව හේතුවෙන් සැලැසුමෙහි ප්‍රකාරව පසු පිරවීම් සහ තාවකාලින මාර්ග පුනස්ථාපනය සිදු නොකර තිබුණි. | වැඩ බිම් පරික්ෂාව 2021 අප්‍රේල් 27 වැනි දින උදයවරුවේදී සිදු කර ඇති අතර එම වැඩබිම් සියල්ලම 2021 අප්‍රේල් 25 හෝ26 දිනවල වැඩ සිදු කර ඇති අතර එම දින දෙක තුල ප.ව. 7.00 සිට ප.ව. 10 දක්වා තද වැසි ඇති වී තිබුණි. මෙම සියළු වැඩ බිම් දිවා කාලයේදී ආරම්භ වී සාමාන්‍යයෙන් ප.ව. 10.00 පමණ අවසන් කර තිබුණි. එම නිසා ඒබීසී ස්ථරයේ ඇති අතිරික්ත ජල පරිමාණය හේතුවෙන් මෙම සියළු වැඩබිම්වල තාවතාලික මාර්ග පුනස්ථාපනය නිසි ලෙස නිම කිරීමට නොහැකි වූ අතර වැඩබිම්වල ප්‍රමාණවත් ලෙස වියළී ගිය පසු තාවකාලින මාර්ග පුනස්ථාපනය නැවත සිදු කිරීමට පීඅයියු කාර්ය මණ්ඩලය දැනුම් දී ඇත. ඒ අනුව, මෙම වැඩබිම් සියල්ලෙහිම දින දෙක හා තුනකට පසුව අවශ්‍ය ප්‍රමිතින්ට අනුකූලව පුනස්ථාපන කටයුතු සම්පූර්ණ කර තිබූ බවට පසුව සහතික කරන ලදී. | අදාල සැලසුම් හා ප්‍රමිතීන්ට අනුව නල එලීම් කටයුතු සිදු කල යුතු අතර පරිශ්‍රයේ කටයුතු සමීපව අධීක්ෂණය කල යුතුය. |
| (ඇ) | අයිසිබී 03 කොන්ත්‍රාත්තුවේ 12 බී හා 21 දරණ දිස්ත්‍රික් මිනුම් ප්‍රදේශවල සිදු කරන ලද භෞතික පරික්ෂාවට අනුව මාර්ග 07කට අදාලව මීටර් 1,992.23 ක තාවකාලික මාර්ග පුනස්ථාපන කටයුතු අවසන් කර ස්ථිර මාර්ග පුනස්ථාපනය සිදු නොකර මාස 06 සිට 12 දක්වා පරාසය පුරා නඩත්තු කරමින් සිටින බව නිරීක්ෂණය විය. තවද, 2021 දෙසැම්බර් 31 දිනට මින් මීටර් 1,830.5 ක සම්පීඩන පරික්ෂාවන් සිදු කර නොමැත. එබැවින් එය මාර්ග මතු පිටට අහිතකර ලෙස බලපෑම් කෙරෙනු ඇත. | සටහන් කර ගන්නා ලදී. කෙසේ වෙතත්, මහජන අපහසුතාවයන් අවම වන පරිදි තාවකාලික මාර්ග පුනස්ථාපනය සතුටුදායක මට්ටමක පවත්වා ගැනීමට අපි සැමවිටම උත්සහ කරන්නෙමු. | ප්‍රමාදයකින් තොරව ස්ථිර මාර්ග පුනස්ථාපනය සිදු කල යුතුය. |

### 3.4. මතභේදයට තුඩු දුන් කරුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දක්වා කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය අඩු කිරීමේ පද්ධති පුනරුත්තාපන කොන්ත්‍රාත්තුව (අයිසීබී 03) යටතේ කොළඹ මහ නගරසභාව වෙත රු.මිලියන 60.53 ක් මාර්ග අවසරය සඳහා ආපසු ගෙවීමේ තැන්පතු ලෙස ගෙවා තිබුණි. එයින් රු.මිලියන 3.78 ක් සමාලෝචිත වර්ෂයේදී නැවත ලැබී තිබූ අතර එය භාණ්ඩාගාරයට මාරු කරනවා වෙනුවට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත භාර දී තිබුණි. එබැවින් ආපසු ගෙවිය හැකි තැන්පතු ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් උපයෝගී කර නොගත් ණය ලෙස ඉතිරි කර ව්‍යාපෘති කාලසීමාව අවසන් වන විට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ගිණුම් පොත් වෙත ගෙන එන ඇති බව අනාවරණය විය. | ණය මුදල් සහ දේශීය අරමුදල් හරහා ලැබෙන කිසිදු අරමුදලක් ව්‍යාපෘතියේ තබා ගැනීමට හෝ භාවිතා කිරීමට නොහැකි බැවින්, මෙම ආපසු ගෙවීමේ මුදල් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත යවනු ලැබේ. ව්‍යාපෘතිය විසින් විගණකවරුන්ගේ අදහස ජාතික ජල සම්පාදන හා ජලාපවහනය වෙත සන්නිවේදනය කර විගණකවරුන් යාවත්කාලීන කරනු ලැබේ. | ණය මුදල් වලින් ආපසු ගෙවිය යුතු තැන්පතු සිදු නොකළ යුතුය. ව්‍යාපෘතිය අවසානයේ එබැවින් තැන්පතු තිබේ නම් ඉතිරි මුදල උපයෝගී නොකළ ණය මුදලක් ලෙස භාණ්ඩාගාරයට මාරු කල යුතුය. |

### 3.5 අතිරේක ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත් 03 ක අන්තර් ගෙවීම් බිල්පත් ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 24.8 ක් ගෙවා තිබුණි. | 2017 මාර්තු මාසයේදි අත්තිකාරම් ගෙවීම් ඇතුළු ගෙවීම් නිකුත් කරන අවස්ථාවේදී රජයේ භාණ්ඩාගාරයේ අරමුදල් නොතිබීම නිසා එය ගෙවා තිබුණි. | ප්‍රමාදයකින් තොරව ගෙවීම් කිරීමට පියවර ගත යුතුය. |

## 3.6 උපයෝජනය නොකළ සම්පත්

| අනු අංක | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 2,272.5 ක් වෙන්කර ඇති අතර සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුල භාවිතා කළ ප්‍රතිපාදන වලින් රු.මිලියන 1602.41 කට සමාන සියයට 70 ක් පමණි. | කොන්ත්‍රාත්කරුගේ ප්‍රධාන වැඩ සටහනට අනුව කොන්ත්‍රාත් 3 සඳහා අරමුදල් වෙන් කළේය. කෙසේ වෙතත්, කොවිඩ් වසංගතය හේතුවෙන් අපට සන්ධිස්ථාන කරා ළඟා විය නොහැකිවිය. එබැවින් අරමුදල් උපයෝජනය නොවීය.<br>කොන්ත්‍රාත් පැකේජ 04 සඳහා රු.මිලියන 1150ක් වෙන් කර ඇති අතර සත්‍ය වියදම 2020 වර්ෂය සඳහා රු.මිලියන 783 ක් විය. මෙය ප්‍රධාන වශයෙන් සිදු වූයේ රටේ වසංගතය තත්ත්වය නිසා වන අතර නියමිත පරිදි ද්‍රව්‍ය මිලදී ගැනීමට නොහැකි විය. | වෙන් කල අරමුදල නියමිත කාල සීමාව තුල භාවිතා කිරීමට උපරිම උත්සහයක් ගත යුතුය. |
| (ආ) | වැඩ පූර්ව අත්තිකාරම් ලෙස දේශීය සංරචකය යටතේ රු.මිලියන 577.67 ක් ද විදේශීය සංරචකය යටතේ ඇ. ඩො. මිලියන 4.15ක් 2017 පෙබරවාරි 22 දින අයිසිබී 04 කොන්ත්‍රාත්තුව වෙත ගෙවා තිබුණද කොන්ත්‍රාකරුගේ දුර්වල භෞතික හා මූල්‍ය කාර්ය සාධනය නිසා කොන්ත්‍රාත් කාලය මාස 48න් මාස 42 ක් ගතවීමෙන් පසුද කිසිදු මුදලක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | අපි මෙම තත්ත්වය නිරීක්ෂණය කල අතර කොන්ත්‍රාත්කරුගේ කැමැත්ත ඇතිව නව අයකර ගැනීමේ සැලැස්මක් සකස් කළෙමු. ඒ අනුව, නව ක්‍රමක්ෂය අනුපාතයක් සකස් කරන ලද අතර කොන්ත්‍රාත් කොන්දෙසි සපුරාලීමෙන් අනතුරුව අත්තිකාරම් ගෙවීම් අය කරනු ලැබේ. | නව අය කර ගැනීමේ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට වහාම පියවර ගත යුතුය. |
| (ඇ) | ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතිය අවසන් කිරීමට සැලසුම් කල දිනය 2019 ජුනි 30 වන අතර පසුව, කොන්ත්‍රාත් ප්‍රදානය ප්‍රමාදවීම, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්ය සාධානය, සහ ව්‍යාපෘති අධීක්ෂණ කටයුතු වල අකාර්යක්ෂමතාවය හේතුවෙන් ව්‍යාපාති කාලසීමාව 2022 ඔක්තෝම්බර් 22 දක්වා දීර්ඝ කරන ලදි. එහි ප්‍රතිඵලක් ලෙස, 2020 දෙසැම්බර් 31 දිනට ණය දෙන ආයතනය විසින් වෙන්කරන ලද ඇ.එ.ජ ඩො මිලියන | දුෂ්කරතා:<br>1. නිවැරදි සිතියම් සහ ජී.අයි.එස් දත්ත නොලැබීම හේතුවෙන් ඇති වූ අනපේක්ෂිත භූගත උපයෝගීතාවන්,<br>2. සීඑම්සී, ආර්ඩීඒ, එස්එල් පොලීසිය, එස්එල්එල් ආර්ඩීසී, එස්එල්පීඒ ,එස්එල් පෙට්රෝලියම් කෝපරේෂන් වැනි වෙනත් ආයතනවල අවසරයන් ප්‍රමාද වීම. | දීර්ඝ කිරීම් කාලය තුල ව්‍යාපෘතිය නිම කිරීමට සහ කොන්ත්‍රාත්කරුවන්ගේ ප්‍රගතිය සමීපව අධීක්ෂණය කිරීමට පියවර ගත යුතුය. |

මිලියන 79.95න්, ඇ.එ.ජ ඩො මිලියන 44.38 කට සමාන රු.මිලියන 7,413.25 එනම් සියයට 55 ක නියෝජනයක් උපයෝජනය කර තිබුණි. එබැවින් ණය ගිවිසුමේ ඇස්තමේන්තුගත වටිනාකම ඉක්මවා බැදීම් ගාස්තු ඉහළ යාම සහ කොළඹ නගරයේ ආදයම් නොලබන ජලය අඩුකිරීම ප්‍රමාද වීමත් නිරීක්ෂණය විය.

3. කොළඹ මහ නගර සභාවේ ප්‍රමුඛතාවය නිසා ප්‍රමාද වීම, අපගේ වැඩ සටහනට අනුව ඉදිරියට යා නොහැකි වීම.
4. වෙනත් උපයෝගීතා නැඹුරු වීම සහ වැඩ සඳහා අනුමැතිය ලබා ගැනීම
5. කොවිඩ් වසංගතය හේතුවෙන් අපට සන්ධිස්ථාන කරා ළඟා විය නොහැකිවීම.

## 3.7 පද්ධති හා පාලනයන්

| අනු අංක | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|
| (අ) | කොළඹ බටහිර කොටස ආදායම් නොලබන ජලය අඩු කිරීමේ පද්ධති පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුවෙහි (අයිසීබී - 03) 2020 සැප්තැම්බර් 30 දිනට අන්තර් ගෙවීම් බිල්පත්‍ර අංක 21ට අනුව විචලතා කමිටුවේ අනුමැතිය ලබාගැනීමේ පදනම මත රු.මිලියන 97.87 ක් 2020 සැප්තැම්බර් 30 දිනට ගෙවා තිබුණි. මින් රු.මිලියන 86.23 ක විචලතා නියෝග සඳහා 2021 මාර්තු 22 දිනය වන විටත් විචලතා නියෝග කමිටුවෙන් අනුමැතිය ලබා ගෙන නොතිබු බව නිරීක්ෂණය විය. | සවිස්තරාත්මක සැලැස්මට අනුව අප සතුව තාවකාලික සංශෝධිත මිල ප්‍රමාණ පත්‍රයක් ඇත. ඒ අනුව, අප ව්‍යාපෘතියේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කරමින් සිටින්නෙමු. සමහර අයිතම සඳහා රේටයන් කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කරමින් පවතී. එබැවින් අපි ප්‍රමාද ගාස්තු ගෙවීම වැලැක්වීම සඳහා සහතික නොකල විචලතා අයිතමයන් අන්තර් ගෙවීම් බිල්පත් හරහා කොටසක් නිර්දේශ කිරීම. සමහර අයිතම අදාල ඩීඑම්ජ් බිල්පත්‍ර සමඟ ගත හැකි වුවද, එම අයිතමය අනෙකුත් ඩී.එම්ජ් බිල් පත්‍ර සමඟ ලබාගත නොහැකිය. එබැවින් , එය විචලතාවක් ලෙස සලකනු ලැබේ. | විචලතා කමිටුවලින් අනුමැතිය ලබා ගැනීමට සහ ගෙවීම් කිරීමට පෙර කමිටු අනුමැතිය ලබා ගැනීමට ක්ෂණික පියවර ගත යුතු. |
| (ආ) | අයිසිබී 03 කොන්ත්‍රාත්තුවට අදාලව විචලතා නියෝග 14 ක් සඳහා රු.මිලියන 64.06 ක් අනුමත කර තිබුණි. කෙසේ වෙතත් , 2020 සැප්තැම්බර් 30 දිනට අත්තර් ගෙවීම් බිල්පත්‍ර 21ට අනුව විචලතා නියෝග කමිටුවේ අනුමැතිය ඉක්මවා රු.මිලියන 80.15 ක් ගෙවා තිබු බව නිරීක්ෂණය විය. තවද, එය 2021 මාර්තු 22 වන විට එය රු.මිලියන 83.01 දක්වා වැඩි වී තිබුණි. | සාමාන්‍ය කොන්ත්‍රාත් කොන්දේසි (GCC) වගන්තියේ 12.3(අ) උප වගන්තිය අනුව ප්‍රමාණය වැඩිවීම විචලතාවයට හේතුවක් විය නොහැකිය. ඒ අනුව. මිල ප්‍රමාණ පත්‍රය හෝ අනුමත විචලතා රේටයට අනුව ප්‍රමාණය වැඩිවීම සහතික කර ඇත. | විචලතා කමිටු වලින් අනුමැතිය ලබා ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අයිසිබී 03 කොන්ත්‍රාත්තුවේ මාර්ග 15 ක නල එලීම් කටයුතු අවසන් කර තිබු අතර 2020 දෙසැම්බර් 31 දිනට කොළඹ මහ නගර සභාව වෙත භාර දී දිනට මාස 01 සිට මාස 18 ක කාලයක පරාසයක ඔබ්බට පැවතුණි. කෙසේ වෙතත්, 2021 මාර්තු 31 දින දක්වාත් එකතුවවු රු.මිලියන 5.42 ක් නැවත අය කර ගැනීමට ඉල්ලීම් කිරීමට පියවර ගෙන නොතිබුණි. | ආපසු ගෙවීමේ තැන්පතු නැවත ලබා ගැනීමේදී කොළඹ මහා නගර සභාවේ සැලකිය යුතු ප්‍රමාදයක් පවතී. ආපසු ගෙවීමේ තැන්පතු ලබා ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා කොළඹ මහ නගර සභාව සමඟ අඛණ්ඩව සම්බන්ධිකරණයක් සිදු වෙමින් පවතී. | තැන්පතු ආපසු ලබා ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඇ) | 2020 අගොස්තු 20 දින වන විට අයිසීබී 04 කොන්ත්‍රාත්තුව යටතේ මාර්ග 32 ක එලීම් කටයුතු අවසන් කර කොළඹ මහ නගර සභාව වෙත භාර දී තිබු අතර 2021 මාර්තු 31 දක්වා ආපසු ගෙවීමේ තැන්පතු ලබා ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | අදාල ව්‍යාපෘති කළමනාකරු මේ සඳහා සහභාගිවේ. | තැන්පතු ආපසු ලබා ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ඉ) | 2010 ජුලි 26 දිනැති කළමනාකරණ චක්‍රලේඛ අංක 05ට අනුව ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් ව්‍යාපෘති ක්‍රියාකාරකම් විගණනය කර නොතිබුණි. තවද, ව්‍යාපෘති කාර්යාලය සඳහා 2016 ජුනි 10 දිනැති අංක 02/20016 චක්‍රලේඛයට අනුව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට ව්‍යාපෘති කාර්යාලය පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු නොමැත | අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |